රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 04/03

මගේ අංකය: E/1/92/1/2003
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
අංක: 46, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.
2003 දෙසැම්බර් මස 02 දින.

ලේකම්, මානව සම්පත් සංවර්ධන, අධ්‍යාපන හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
ලේකම්, ස්වදේශ කටයුතු, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය,
සියලුම පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
සියලුම පළාත් ආණ්ඩුකාර ලේකම්වරුන්,
සියලුම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,

## පළාත් රාජ්‍ය සේවයේ තනතුරු දරන <u>අධ්‍යාපන පිරිස් සම්බන්ධයෙන් කටයුතු කිරීම</u>

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ පළාත් රාජ්‍ය සේවයේ අධ්‍යාපන පිරිස් සම්බන්ධයෙන් සඳහන් වන විධිවිධානද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 වන සංශෝධනයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව සම්බන්ධයෙන් සඳහන් වන විධිවිධානද වඩාත් කාර්යක්ෂමව, ප්‍රායෝගිකව හා අදාළ විධිවිධානයන්ට අනුකූලව ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවද,

මධ්‍යම රජයේ තනතුරුවල සේවය කරන හා පළාත් රාජ්‍ය සේවයේ තනතුරුවල සේවය කරන අධ්‍යාපන පිරිස් සම්බන්ධයෙන් එකම ජාතික ප්‍රතිපත්තියක් මත ක්‍රියාකිරීමේ යෝග්‍යතාව ද, සැලකිල්ලට ගෙන,

රාජ්‍ය සේවා කොමිෂන් සභාව පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට තීරණය කර ඇත.

(1) <u>ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය :</u>

| | |
|---|---|
| I. සේවයට පත්කිරීම, උසස් කිරීම | - ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය දීප ව්‍යාප්ත සේවාවට අයත්වන බැවින්, අනෙකුත් දීප ව්‍යාප්ත සේවාවන්ට අදාලවන පරිදිම සේවයට පත්කිරීම, උසස් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ඇත. |

..2/

| | |
|---|---|
| II. පළාත් රාජ්‍ය සේවයේ තනතුරුවලට තාවකාලිකව මුදාහැරීම | - නිලධාරියාගේ කැමැත්ත හා අදාල පළාත් බලධාරීන්ගේ එකඟතාවයද මත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින්, අදාල පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත නිලධාරියා ද්විතියන පදනම මත තාවකාලිකව මුදාහරිනු ලැබේ. |
| III. පළාත් රාජ්‍ය සේවයට මුදාහරින කාලය තුල විනය පාලනය | - ද්විතියන පදනම මත තාවකාලිකව පළාත් රාජ්‍ය සේවයට මුදාහරින ලද කාලය තුලදී එම නිලධාරීන්ගේ විනය පාලනය පළාත් බලධාරීන් විසින් ඉටුකරනු ඇත. එසේ වුවද විනය තීරණයක් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා කිරීමේ අයිතිවාසිකම නිලධාරීන් වෙත ඇත්තේය. |
| IV. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරට පත්කිරීම | - මෙම තනතුර මධ්‍යම රජයේ හා පළාත් සභාවලද අධ්‍යාපන කටයුතු සම්බන්ධ ද්විත්ව රාජකාරී වගකීම් දරණ තනතුරක් වන බැවින් පළාත් ආණ්ඩුකාරතුමා විසින් නම් කරනු ලබන නිලධාරියකුද නියෝජනය වන සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරාගනු ලබන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I පංතියේ නිලධාරියකු ඒ සඳහා පත්කරනු ලැබේ. පළාත් සභා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් බලධාරීන් විසින් ඔහු වෙත වෙනම පත්වීම් ලිපියක් නිකුත් කරනු ඇත. |
| V. අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරුවලට පත්කිරීම. | - මෙම තනතුරු සඳහා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I පංතියේ නිලධාරීන් පළාත් බලධාරීන් විසින් පත්කරනු ඇත. |
| VI. පුරප්පාඩු තනතුරු සඳහා වැඩබැලීමට/වැඩ ආවරණය කිරීමට පත්කිරීම. | - පුරප්පාඩු වන තනතුරකට සේවයේ අදාල පංතියේ ප්‍රමාණවත් නිලධාරීන් පිරිසක් නොමැති අවස්ථාවලදී ඊළඟ පංතියට අයත් නිලධාරීන් අතුරින් ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨත්වය සහ කුසලතාවය මත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරාගනු ලබන නිලධාරියෙකු පළාත් බලධාරීන් විසින් පත් කරනු ලැබේ. |

.. 3/

**VII. ස්ථානමාරු කිරීම** - අනුමත ස්ථානමාරු ප්‍රතිපත්තියක් මත, පළාත තුල ස්ථානමාරුවීම් පළාත් බලධාරීන් විසින් සිදුකරනු ඇත. සේවක සංඛ්‍යාවද සැලකිල්ලට ගෙන (සාමාන්‍ය/විශේෂ) සමාන තනතුරකින් සමාන තනතුරකට ස්ථානමාරු කිරීම කළයුතුවේ.

I. එක් පළාත් රාජ්‍ය සේවයකින් තවත් පළාත් රාජ්‍ය සේවයකට ස්ථානමාරු වීමේදී.

II. පළාත් රාජ්‍ය සේවයේ තනතුරකින් මධ්‍යම රාජ්‍ය සේවයේ තනතුරකට ස්ථානමාරු වීමේදී.

III. මධ්‍යම රජයේ තනතුරකින් පළාත් රාජ්‍ය සේවයේ තනතුරකට ස්ථානමාරු වීමේදී.

අදාල වන පරිදි රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් හෝ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් විධිමත්ව මුදාහැරීමෙන් පසුව අදාල බලධාරීන් විසින් සිදුකරනු ඇත. (පළාත් රාජ්‍ය සේවයේ තනතුරකට නම් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ද, මධ්‍යම රජයේ තනතුරකට නම් අධ්‍යාපන අමාත්‍යාංශය විසින්ද)

**VIII. සේවා දීර්ඝ කිරීම හා විශ්‍රාම ගැන්වීම** - අනෙකුත් දීප ව්‍යාප්ත සේවාවන්ට අදාල වන පරිදිම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින්ම සිදුකරනු ලැබේ. පළාත් රාජ්‍ය සේවයේ සිටින නිලධාරීන් සම්බන්ධයෙන් අදාල පළාත් බලධාරීන්ගේ නිර්දේශ ලබාගනු ඇත.

**IX. වැටුප් වර්ධක අනුමත කිරීම** - පළාත් රාජ්‍ය සේවයේ තනතුරු දරමින් සිටිනවිට ඔවුන්ගේ වැටුප් වර්ධක පහත සඳහන් බලධාරීන් විසින් අනුමත කරනු ලැබේ.

III පංතියේ නිලධාරීන් - පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ.
II පංතියේ නිලධාරීන් - පළාත් අධ්‍යාපන ලේකම්.
I පංතියේ නිලධාරීන් - පළාත් ප්‍රධාන ලේකම්.

.. 4.

(2) <u>ශ්‍රී ලංකා විදුහල්පති සේවය :</u>

| | |
|---|---|
| I. සේවයට පත්කිරීම, උසස් කිරීම | - විදුහල්පති සේවා ව්‍යවස්ථා නියමයන්ට අනුකූලව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදුකරනු ලැබේ. |
| II. පළාත් රාජ්‍ය සේවයේ තනතුරුවලට පත්කිරීම | - පළාත් රාජ්‍ය සේවයේ සිටින විදුහල්පති ශ්‍රේණිධාරීන් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුමත පාසැල් වර්ගීකරණයට අනුකූලවන පරිදි ඒ ඒ තනතුරුවලට පත්කිරීම් පළාත් බලධාරීන් විසින් සිදුකරනු ලැබේ. |
| III. 1 A, B, C පාසල්වල විදුහල්පතිවරුන් පත්කිරීම | - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ III පරිශිෂ්ඨයට අනුව 1 A,B,C පාසැල්වලට විදුහල්පතිවරුන් පත්කිරීමේ බලතල මධ්‍යම රජය සතුවන බැවින් ජාතික පාසල්වලට විදුහල්පතිවරුන් පත්කිරීමේ ක්‍රමයම අනුගමනය කොට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් සිදුකරනු ඇත. |
| IV. ස්ථානමාරු කිරීම | - අනුමත ස්ථානමාරු ප්‍රතිපත්තියක් මත විදුහල්පති සේවයේ නිලධාරීන් පළාත තුල ස්ථානමාරු කිරීම පළාත් බලධාරීන් විසින් ද සිදු කෙරේ. ස්ථානමාරු කිරීමේදී අමාත්‍යාංශ පාසැල් වර්ගීකරණයට අනුකූලව නියමිත ශ්‍රේණිධාරීන් අදාල තනතුරුවලට ස්ථානමාරු කිරීම කළයුතු වේ. |
| V. ස්ථානමාරු කිරීම සඳහා මුදාහැරීම . | I. එක් පළාත් රාජ්‍ය සේවයකින් තවත් පළාත් රාජ්‍ය සේවයකට ස්ථානමාරු වීමේදී.<br>II. පළාත් රාජ්‍ය සේවයකින් මධ්‍යම රාජ්‍ය සේවයේ තනතුරකට ස්ථානමාරු වීමේදී.<br>III. මධ්‍යම රාජ්‍ය සේවයෙන් පළාත් රාජ්‍ය සේවයේ තනතුරකට ස්ථානමාරු වීමේදී.<br>අදාල බලධාරීන් විසින් විධිමත්ව මුදාහැරීම කළයුතු වේ. |

.. 5/

| | |
|---|---|
| VI. විනය පාලනය | - පළාත් රාජ්‍ය සේවයේ තනතුරු දරණ විදුහල්පති ශ්‍රේණිධාරීන් සම්බන්ධයෙන් අදාළ පළාත් බලධාරීන් විසින් සිදුකරනු ඇත. එහෙත් සේවයෙන් පහකිරීමකට අදාළව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා කිරීමේ අයිතිය අදාළ නිලධාරීන් සතුවේ. |
| VII. සේවා දීර්ඝ කිරීම හා විශ්‍රාම ගැන්වීම | - විදුහල්පති සේවයේ I පංතියේ නිලධාරීන්ගේ සේවා දීර්ඝ කිරීම හා විශ්‍රාම ගැන්වීම අදාළ බලධාරීන්ගේ නිර්දේශ මත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදුකරනු ඇත. පළාත් රාජ්‍ය සේවයේ සේවය කරන අනිකුත් ශ්‍රේණිවලට අයත් නිලධාරීන් සම්බන්ධයෙන් පළාත් බලධාරීන් විසින් කටයුතු කරනු ඇත. |

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි.

H.P.L. Goonewardene.

( එච්.පී.එල්.ගුණවර්ධන )

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

:/23